පේදුරුතුඩුව ප්‍රාදේශිය සභාව

යාපනය දිස්ත්‍රික්කය

---------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

--------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 16 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කර ඇත.

1.2 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව පේදුරුතුඩුව ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්විම්

-------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

(අ) වත්කම්, ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑම | වත්කම් | | ආදායම් | | වියදම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. |
| අඩුවෙන් දැක්වීම් | 02 | 6,119 | 01 | 278,736 | 01 | 450,878 | 01 | 3,466 |
| වැඩියෙන් දැක්වීම් | - | - | 01 | 2,801,023 | - | - | - | - |
| වර්ගීකරණ දෝෂ | 06 | 183,735 | - | | - | - | - | - |

(ආ) අත්හැරීම්

විවිධ ආයතනයන් විසින් 1998 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය තුලදී සභාවට පරිත්‍යාග කරන ලද වාහන 25 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා නොතිබුණු අතර ඒවායේ වටිනාකම සොයා දැනගෙන නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.29,069,134 ක් වූ ගනුදෙනු 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු.873,359 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.24,040,350 ක් විය.

2.2 මූල්‍ය පාලනය

-----------------

අයවැය ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අයවැයගත ආදායම සහ තථ්‍ය ආදායම අතර රු.25,853,281 ක වෙනසක් ද අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර රු.4,650,332 ක වෙනසක් ද විගණනයේදී නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

--------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළව සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දින සමුච්චිත හිඟ |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 28 | 132 | 744 |
| බදු කුලි | 4,212 | 2,739 | 214 |
| බලපත්‍ර ගාස්තු | 374 | 414 | - |
| වෙනත් ආදායම් | 21,843 | 49,025 | 35,204 |

2.3.2 හිඟ ආදායම්

----------------

වර්ෂ 5 කට අධික කාලයක් තිස්සේ වරිපණම් බදු, කුලී සහ වෙළඳ පොළ බදු වලට අදාළ රු.958,122 ක් වූ ආදායම් ණයගැති හිඟය අයකර ගැනිම සඳහා නීතිමය පියවර ගෙන නොතිබුණි.

2.3.3 ආදායම් අහිමි වීම

විදුලිබලය සැපයීම කටයුතු සඳහා 1999 වර්ෂයේ සිට ලංකා විදුලිබල මණ්ඩලය වෙත භාර දී තිබුණි. කෙසේ වුවද සභාබල ප්‍රදේශය තුල වීදි ලාම්පු නඩත්තුව වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් අයවිය යුතු රු.1,506,750 ක මුදල ප්‍රතිපූර්ණය කර නොතිබුණු අතර ඒ නිසා සභාවට පාඩුවක් සිදු වී තිබුණි.

2.3.4 උසාවි දඩ

-----------

2012 වර්ෂය වෙනුවෙන් මහේස්ත්‍රාත් අධිකරණ වෙතින් ලැබිය යුතුව තිබූ රු.6,465,633 ක් වූ උසාවි දඩ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.3.5 මුද්දර ගාස්තු

----------------

(අ) ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් 2012 ජුනි සිට කාලපරිච්ඡේදය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආදායම් සහ ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කළ ප්‍රමාණය හැර 2010 සිට 2012 කාල පරිච්ඡේදය සඳහා උපලේඛණගත කළ රු.28,737,893 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනිමට අර්ථවත් ලෙස කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ලැබිය යුතු මුද්දර ගාස්තු |
|---|---|
| | රු. |
| 2010 | 8,968,628 |
| 2011 | 13,199,955 |
| 2012 (ජුනි) | 6,569,310 |
| | --------------- |
| | 28,737,893 |
| | ========== |

2.4 වත්කම් කළමනාකරණය

--------------------------------

2.4.1 නිෂ්ක්‍රීය සහ ඌණ උපයෝජිත භෞතික සම්පත්

------------------------------------------------------

සුළු අළුත්වැඩියා කිරිමකින් පසුව භාවිතයට ගතහැකිව තිබූ වාහන 12 ක් අළුත්වැඩියා කිරිමට කටයුතු නොකොට නිෂ්ක්‍රියව තිබුණි.

2.4.2 වාර්ෂික සමික්ෂණ මණ්ඩල වාර්තා.

-------------------------------------------

2012 වර්ෂයේ සමික්ෂණ මණ්ඩල වාර්තාව අනුව විෂයයන් 08 ක ඌණතාවයක් පැවති අතර විෂයයන් 19 ක් උපයෝජනය කර නොතිබුණි. මෙම ඌණතා සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. කුඩ්ඩතානි උප කාර්යාල පුස්තකාලයේ තිබූ පොත් 85 ක් සම්බන්ධයෙන් සමික්ෂණ මණ්ඩලය විසින් තහවුරු කිරිමක් කර නොතිබුණි.

2.4.3 අය නොකළ කාර්ය මණ්ඩල ණය ශේෂ

----------------------------------------------

විනය ක්‍රියාමාර්ගයක් හේතුවෙන් 2008 වර්ෂයේ සිට සභාවේ නිලධාරියෙකුගේ වැඩ තහනම් කර තිබුණු අතර ඔහුගෙන් අයවිය යුතු රු.141,150 ක් වූ ණය ශේෂය අයකර ගෙන නොතිබුණි.

2.5 නීති, රිති, රෙගුලාසි ආදියට අනුකූල නොවිම

----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදි නිරික්ෂණය විය.

| නීති, රිති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව. | | අනුකූල නොවිම් |
|---|---|---|
| (අ) <u>1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත</u> | | |
| (i) V පරිච්ඡේදයේ 132 වගන්තිය | - | වර්ෂයකට රු.1000 ඉක්ම වූ සත්කාරක |

වියදම් සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. කෙසේ වුවද එවැනි අනුමැතියක් ලබා නොගෙන සත්කාරක කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.11,305 ක් ගෙවා තිබුණි.

(ii) V පරිච්ඡේදයේ 158(1) වගන්තිය - තක්සේරු බදු ගෙවීමට අපොහොසත් වූ අයගෙන් අයවිය යුතු රු.744,165 ක් වූ හිඟ වරිපණම් බදු අයකර ගැනිමට හැකි වන පරිදි ලේකම්වරයා විසින් වොරන්ට් නිවේදන නිකුත් කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශිය සභා (මූල්‍ය සහ පරිපාලන) රීති - 1988 -

-------------------------------------------

(i) III පරිච්ඡේදයේ 70 වගන්තිය - කාලය ඉකුත් වීමෙන් පසුව රු.213,957 ක් වූ හිඟ කුලී වෙනුවෙන් ආදායම් ලිපිකරු විසින් පැහැර හැරියවුන්ගේ ලැයිස්තුවක් පිළියෙල කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) III පරිච්ඡේදයේ 81 වගන්තිය - එක් එක් කාර්තුව සඳහා වූ මුද්දර ගාස්තු සහ උසාවි දඩ ගෙන්වා ගැනිම වෙනුවෙන් සභාව විසින් පියවර ගෙන නොතිබුණි.

(iii) V පරිච්ඡේදයේ 140 වගන්තිය - නිරවුල් නොකළ අත්තිකාරම් රු.10,171,705 වෙනුවෙන් ලේකම්වරයා කටයුතු කර නොතිබුණි.

2.6 අරමුණු වලින් බැහැර වූ කරුණු

-------------------------------------

(අ) සුනාමියෙන් විපතට පත් ජනතාවට පානීය ජලය සහ සෞඛ්‍ය පහසුකම් සැපයීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පරිත්‍යාග කරන ලද රු.894,615 ක් වූ මුදලක් අපේක්ෂිත කාර්යයන් සඳහා යොදාගෙන නොතිබුණු අතර එම මුදල කාර්යාල ගොඩනැගිල්ල සහ මරුතන්කර්නි සෘතකාගාරය ඉදිකිරීම සඳහා යොදාගෙන තිබුණි.

(ආ) සභාවේ අරමුණක් නොවූ හෝ පළාත් පාලන සමුළු ප්‍රදර්ශනය - 2012 ට අදාල නොවූ " නැවත පදිංචිකල ගම්මාන ආදර්ශය " ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් රු.24,950 ක් වැයකර තිබුණි.

2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය

------------------------------------------

(අ) සභාවේ ප්‍රවර්තන වර්ෂය අයවැය ලේඛණය මගින් අනුමත නොකළ ප්‍රාග්ධන වැඩ 05 කට අදාළව ඉදිරි කාලයේදි ක්‍රියාත්මක කිරීමේ අරමුනෙන් විවිධ ණය හිමියන් යටතේ රු.3,509,158 ක මුදලක් වෙන්කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල සිදු කිරීමට සැලසුම් කළ මාර්ග සහ වෙළඳපොල සංකීර්ණය ඇතුළු රු.6,500,000 ක් වටිනා ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

2.8 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

(අ) පළාත් පාලන කොමසාරිස්වරයා විසින් 2009-2010 කාලය තුල ප්‍රජා මධ්‍යස්ථානයක් සඳහා පරිත්‍යාග කරන ලද රු.301,516 ක මුදලක් අදාල කාර්යයන් සඳහා යොදා නොගෙන විවිධ තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ආ) 2010-2012 කාලපරිච්ඡේදය සඳහා වූ රු.147,265 ක් වූ පරිසර බලපත්‍ර ගාස්තු පරිසර වාරක පරික්ෂාව සඳහා යොදා නොගෙන විවිධ තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

3. පද්ධති සහ පාලන

----------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ආදායම් රැස්කිරීම

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ගිණුම්කරණය

(ඈ) මානව සම්පත්

(ඉ) පරිත්‍යාග

(ඊ) වාහන උපයෝජනය

(උ) විවිධ තැන්පතු

(ඌ) අයවැය පාලනය